# “නමෝ බුද්ධාය”

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

පඤ්චමාරේ ජිතෝ නාථෝ
පත්තෝ සම්බෝධිමුත්තමං,
චතුසච්චං පකාසේසී
මහාවීරං නමාමහං,
ඒතේන සච්ච වජ්ජේන
සබ්බේ මාරා පලායන්තු.

- සුදෙවුන් මහාරජාණන් වැනි පියාණන් කෙනෙකු, රහල් කුමරු වැනි පුත් රුවනක්, යශෝධරා දේවීන් වැනි වූ සසර පුරුදු බිරිඳක හා සක්විති රජකම ද - සතර මහානිධානය ද යන මේ සියල්ල අතහැර දමා කඩ කැපූ කහ වතක් පොරවා මැටි පාත්‍රයක් ගෙන - ගෙන් ගෙට ගොස් පිඬු ලබා පෙර වැළඳූ රජ බොජුන් වෙනුවට දුක් භෝජනයන් වළඳමින් - පෙර සැතපුණු රජ යහන් වෙනුවට ගල් තලා, ගස් මුල් සෙවනේ දුක්ඛ සෙයාාවෙන් ම සැතපී මේ තුන් ලෝකධාතුවේ කිසි ම සත්වයෙකු නොවිඳිනා තරම් අනන්ත අපරිමාණ දුක් විඳ චතුරංග සමන්නාගත වීර්යය උපදවා සියලු කෙලෙසුන් නසා සම්මා සම්බෝධියට පත් වූ මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක.
- භාග්‍යවතුන් වහන්සේගේ දෙනෙතට ලක්ෂණ - අවලක්ෂණ - රූපී - විරූපී - ඉෂ්ට - අනිෂ්ට - සතුරු - මිතුරු කවර රූපයක් ගෝචර වුවත් භාග්‍යවතුන් වහන්සේගේ සිත නම් බිඳකුදු සසල නො වී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල උපේක්ෂාවෙන් යුතු ව ඉවසා වදාළ සේක. සිවු දෙසින් හමන සුළඟට නො සෙල්වෙන පර්වත රාජයෙකු සේ අටලෝ දහම හමුවේ නො සැලී විසීමට භාග්‍යවතුන් වහන්සේට හැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවිනි. ඒ කෙලෙසුන් නැසූ මාගේ අමා මෑණියන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.
- මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක. භාග්‍යවතුන් වහන්සේට වැඳුම් - පිදුම් - ගුණ ගැයුම් - ස්තෝත්‍ර - ප්‍රශස්ති - නින්ද - අපවාද - උපහාස - ආක්‍රෝශ - පරිභව කවරක් ලැබුණත් භාග්‍යවතුන් වහන්සේගේ සිත නම් බිඳකුදු සසල නො වී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල උපේක්ෂාවෙන් යුතු ව ඉවසා වදාළ සේක. සිවු දෙසින් හමන මහාසුළඟට නො සෙල්වෙන පර්වත රාජයෙකු සේ අටලෝ දහම හමුවේ නො සැලී විසීමට භාග්‍යවතුන් වහන්සේට හැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවිනි. ඒ කෙලෙසුන් නැසූ මාගේ ගුරු අමා මෑණියන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.
- මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක. භාග්‍යවතුන් වහන්සේ දිව්‍යමය ආහාරයක් ලදුවත් - තිත්ත - කටුක - රස - නීරස - ගුණ - අගුණ - ඉඳුල් - පිළුණු කවර ආහාරයක් ලදුවත් වෙසෙසක් නො කොට ඒ සියල්ල උපේක්ෂාවෙන් යුතු ව ඉවසා වදාළ සේක. සිවු දෙසින් හමන මහාසුළඟට නො සෙල්වෙන පර්වත රාජයෙකු සේ අටලෝ දහම හමුවේ නො සැලී විසීමට භාග්‍යවතුන් වහන්සේට හැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවිනි. ඒ කෙලෙසුන් නැසූ මාගේ ගුරු තිලෝගුරු අමා මෑණියන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

- මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක. භාග්‍යවතුන් වහන්සේට දිව්‍යමය සුගන්ධයක් ගෝචර වූවත් දින හතක් අටක් පරණ ව ගිය ඕජස් ගලන පණු කැදලි වැගිරෙන මළ මිනියක දුර්ගන්ධයක් ගෝචර වූවත් භාග්‍යවතුන් වහන්සේගේ සිත නම් බිඳකුදු සසල නො වී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල උපේක්ෂාවෙන් යුතු ව ඉවසා වදාළ සේක. සිවු දෙසින් හමන මහාසුළඟට නො සෙල්වෙන පර්වත රාජයෙකු සේ අටලෝ දහම හමුවේ නො සැලී විසීමට භාග්‍යවතුන් වහන්සේට හැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවිනි. ඒ කෙලෙසුන් නැසූ මාගේ ගුරු තිලෝගුරු අමා මෑණියන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.
- මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක. භාග්‍යවතුන් වහන්සේ දිව්‍යමය සුඛාස්වාදයක් ලදුවත් අවු - වැසි - සුළං - කුණාටු - මැසි - මදුරු - සතුරු උවදුරු - ලෙඩ - දුක් - දැඩි ශීත - දැඩි උෂ්ණ කවර පීඩාදියක් ලදුවත් භාග්‍යවතුන් වහන්සේගේ සිත නම් බිඳකුදු සසල නො වී ය. භාග්‍යවතුන් වහන්සේ ඒ සියල්ල උපේක්ෂාවෙන් යුතු ව ඉවසා වදාළ සේක. සිවු දෙසින් හමන මහාසුළඟට නො සෙල්වෙන පර්වත රාජයෙකු සේ අටලෝ දහම හමුවේ නො සැලී විසීමට භාග්‍යවතුන් වහන්සේට හැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවිනි. ඒ කෙලෙසුන් නැසූ මාගේ ගුරු තිලෝගුරු අමා මෑණියන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.
- මාගේ ගුරු තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සියලු කෙලෙසුන් නැසූ බැවින් අරහං නම් වන සේක. භාග්‍යවතුන් වහන්සේ අලුයම් වේලෙහි ලොව බලා වදරන සේක. රජ - නොරජ - සිටු - නොසිටු - දුප්පත් - පොහොසත් - කුලවත් - කුලහීන - උගත් - නූගත් - සත්පුරුෂ - අසත්පුරුෂ කවර තරාතිරමක වූවත් පිහිට වියයුතු තැන දී මහා කරුණාවෙන් ම පිහිට වන සේක. කොසොල් මහරජු කෙරෙහි මෙන් ම සෝපාක නම් සැඬොල් දරුවා කෙරෙහි ද විහාරාරාම ඉදිකළ අනේපිඬු මහසිටු කෙරෙහි මෙන් ම පුණ්ණා නම් අසරණ දසිය කෙරෙහි ද ගුණයෙන් හා සැදැහයෙන් අගතැන්පත් විශාඛා මහෝපාසිකාව කෙරෙහි මෙන් ම තමන් වහන්සේට නින්ද පරිභව කළ චින්චාමානවිකාව කෙරෙහි ද සුවච කීකරු රහල් තෙරණුවන් කෙරෙහි මෙන් ම දෙව්දත් තෙරුන් කෙරෙහි ද මෙසේ සියලු සත්වයන් කෙරෙහි ම වෙනසක් නො කොට සම කරුණාවෙන් ම පිහිට වූ සේක.
- තම දරුවන් දෙදෙනා ද සැමියා ද මාපියන් සහ සොහොයුරා ද අකාලයේ මිය යෑම නිසා මහත් වූ කම්පාවට පත් පටාචාරාවන් කෙරෙහි ද තම එක ම පුතු මළ සොවින් මහත් වූ ශෝකයට පත් කිසාගෝතමිය කෙරෙහි ද වැරදි ගුරු උපදේශ ලදින් අඟුල්මල් නම් මිනීමරුවකු බවට පත්වූ අහිංසක කුමරු කෙරෙහි ද මෙසේ සියලු සත්වයන් කෙරෙහි ම මහාකරුණාවෙන් යුතු ව සම කරුණාවෙන් යුතු ව මහාමෛත්‍රියෙන් යුතු ව සියලු සත්වයන්ට ම පිහිටවීමට භාග්‍යවතුන් වහන්සේට හැකි වූයේ භාග්‍යවතුන් වහන්සේ සියලු කෙලෙසුන් නසා සම්මා සම්බුද්ධත්වයට පත් වූ බැවිනි. ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**අරහං, සම්මා සම්බුද්ධෝ, විජ්ජාචරණසම්පන්නෝ, සුගතෝ, ලෝකවිදූ, අනුත්තරෝ පුරිසදම්මසාරථී, සත්ථා දේවමනුස්සානං, බුද්ධෝ, භගවා'ති.**

**භගවා, බුද්ධෝ, සත්ථා දේවමනුස්සානං, අනුත්තරෝ පුරිසදම්මසාරථී, ලෝකවිදූ, සුගතෝ, විජ්ජාචරණසම්පන්නෝ, සම්මා සම්බුද්ධෝ, අරහං.**

**සාධු! සාධු!! සාධු!!!**

❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්‍දයන් වහන්සේ ගේ ධර්ම දේශනා ඇතුළු පටිගත කරන ලද ධර්ම දේශනා සහ පසුගිය දහම් ලිපි* **www.sadaham.eartefacts.com** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකි ය.*